**ශීර්ෂය 303 - ජේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 අගෝස්තු 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.1.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.4 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ භාණ්ඩාගාර අග්‍රිමය දැක්වීමේදී භාණ්ඩාගාරයෙන් ලද ප්‍රමාණය හා වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් කළ එකතුකිරීම් වෙන වෙනම පෙන්විය යුතු වේ. එහෙත් ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව රු.193,320,778 ක් වූ අග්‍රිම ලැබීම් මුදල හා වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ලද රු.13,233,652 ක මුදල යන වටිනාකම් දෙක එකතුකර රු.206,554,430 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වැරදීමකින් එය අග්‍රිම ලැබීම් යටතේ සටහන් කර ඇත. | මාර්ගෝපදේශයට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු වීම. නිලධාරීන් වෙනුවෙන් කළ එකතුකිරීම් වෙන වෙනම පෙන්විය යුතුය. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් කළ එකතු කිරීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දැක්විය යුතු වුවද රු.13,233,652 ක්වූ එම ලැබීම් භාණ්ඩාගාර අග්‍රිමයට එකතුකර දක්වා තිබුණි. | වැරදීමකින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අග්‍රිම ලැබීම් ලෙස එකතු කර ඇති බව දන්වා ඇත. | වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් කළ එකතු කිරීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ වෙනම දැක්විය යුතුය. |
| (ආ) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව දෙපාර්තමේන්තුව විසින් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද රු.9,494,124 ක්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.9,326,196 ක් ලෙස රු.167,928 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වෙනුවෙන් සහ අනෙකුත් ප්‍රධාන ලෙජර් යටතේ 2020 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුව විසින් වියදම් කරන ලද රු. 10,418,164 ක මුදල සහ වැය ශීර්ෂයන් මගින් 2020 | මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද නිවැරදි මුදල දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| | වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් සහ අනෙකුත් ප්‍රධාන ලෙජර් යටතේ වියදම් කරන ලද රු. 1,031,968 ක මුදලෙහි ශුද්ධ වෙනස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු. 9,326,196 ක මුදලක් ලෙස සටහන් කර ඇත. ඒ අනුව ගිණුම්ගත කරන ලද අගයන් නිවැරදි වන බව. | |
| (ඇ) දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් අයකරගැනීම් රු.4,167,987ක් හා ගෙවීම් රු.6,128,737 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වුවද, එය පිළිවෙලින් රු.3,929,034 ක් හා රු.5,969,973 ක් ලෙස එනම් භාණ්ඩාගාර වගු අංක SA-52 හි සඳහන් ශේෂ පදනම් කරගෙන සකස් කර තිබුණි. | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සම්බන්ධව විගණනය විසින් පෙන්වා දී ඇති ශේෂයන් සහ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ශේෂයන් සැසඳීම අනුව මෙම දෙපාර්තමේන්තුව විසින් ගිණුම් ගත කරන ලද අගයන් නිවැරදි වන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් අයකරගැනීම් හා ගෙවීම් ඒකාබද්ධ ශේෂ පිරික්ෂුම පදනම් කර ගෙන දැක්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 303-2-1-1-2001 දරන වැය විෂයට සලසා තිබූ රු.3,000,000 ක මුලු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | 2020 වර්ෂයේ අතුරු සම්මත ගිණුම් හතරක් යටතේ ප්‍රතිපාදන ලබාදීම, පැවති කොවිඩ් - 19 තත්වය හේතුවෙන් දිවයිනේ බොහෝ ප්‍රදේශ හුදෙකලා ප්‍රදේශ ලෙස වරින්වර නම් කිරීම සහ තැපැල් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම යන හේතු නිසා 2001 වැය ශීර්ෂය යටතේ ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු සඳහා මිල ගණන් කැඳවීමේ හැකියාවක් නොමැති විය. | ප්‍රතිපාදිත මුදල් කාර්යක්ෂමව උපයෝජනය කිරීම. |

### 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 18 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය අනුව නිලධාරියෙකු | ස්ථානමාරු වී ගිය නිලධාරියාගේ ණයගැති ශේෂය නොපියවීම සම්බන්ධව ලිඛිතව විමසීමක් කලද මේ වනවිටද | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වෙනත් දෙපාර්තමේන්තුවකට ස්ථාන මාරුවීම නිසා උද්ගත වන ණයගැති ශේෂ මාස තුනක් ඇතුළත පියවීම් කළ යුතු වුවත්, එසේ නොකළ ශේෂය රු.173,000 ක් වී තිබුණි. | පියවා නොමැති බැවින් නැවත සිහිකැඳවීම් ලිපියක් එම ආයතනය වෙත යොමු කරන ලද බවත් , කඩිනමින් එම ණය පියවීමට කටයුතු කරන බව. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන ගොඩනැගිලි 05 ක් ඉදිකර තිබූ ඉඩම්වල අයිතිය නිරවුල් කර ගෙන නොතිබුණි. | පේෂ පාසල පිහිටි ඉඩම නිරවුල් කරදෙන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටද මාතලේ පේෂකර්ම පාසල පිහිටි ඉඩම නිරවුල් කරදෙන ලෙස දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය මාතලේ වෙත ද ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | ඉඩම්වල අයිතිය නිරවුල් කරගෙන ගොඩනැගිලි ඉදිකිරීම කළ යුතුය. |

**3.2 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.17,018,250 ක බදුකුලී හිඟහිටව පැවතුණි. එම හිඟකුලී අයකරගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර තිබුණද එහි ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කර නොතිබුණි. | අදාළ ලිපි නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර ඉදිරි කටයුතු එම ආයතනය මගින් සිදුකරනු ලබන බව. | හිඟකුලී අයකරගැනීමට අදාළ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කර අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නොවිසඳී ඇති විගණන ඡේද

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේදී ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් දීප ව්‍යාප්ත පේෂ කර්මාන්ත සංගණනය වෙනුවෙන් විස්තරාත්මක දත්ත රැස්කිරීම අදියර දෙකක් යටතේ ආරම්භ කරන ලදි. ජන ලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව හා පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා එක්ව සිදුකරනු ලැබූ මෙම සංගණනය සඳහා රු.මිලියන 16ක වියදමක් ඇස්තමේන්තු කර තිබූ අතර 2017 වර්ෂයේදී සංගණනය අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. 2018 වර්ෂයේ හා 2019 වර්ෂයේදී මෙම සංගණනයේ පළමු අදියර අවසන් කර තිබූ අතර ඒ වෙනුවෙන් රු. 6,133,535ක වියදමක් දරා තිබුණි. නමුත් 2020 අගෝස්තු 31 දින වන විටත් දෙවන අදියරෙහි කටයුතු අවසන් කර නොතිබුණි. | 2020,2021 වර්ෂවලදී අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ඉල්ලා තිබුණද අදාළ ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් සංගණනය අපේක්ෂිත පරිදි සිදු කළ නොහැකි වූ බවත් 2022 වර්ෂයේදී අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගෙන එම සංගණනය අවසන් කිරීමට කටයුතු කරන බවත් දක්වා තිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට හැකි හා ඵලදායී ලෙස සංගණන කටයුතු ඇස්තමේන්තු කළ පරිදි සිදුකර අවසන් කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2030 න්‍යාය පත්‍රයට අනුව 2030 වසරවන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා තාක්ෂණික හා වෘත්තීය කුසලතා ලබා සිටින තරුණ හා වැඩිහිටියන් 5000 කට NVQ මට්ටම් 4 ලබාදීම අරමුණක් ලෙස දෙපාර්තමේන්තුව හඳුනාගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වසරේදී පවත්නා පුහුණු පාසැල් 14 හි සමස්ත ධාරිතාවය ප්‍රයෝජනයට ගෙන නොතිබීම, පුහුණුලාභීන් ක්ෂේත්‍රය තුළ රැඳී සිටීම පිළිබඳව පසු විපරම් සිදුකර නොතිබීම සහ වෘත්තීය | එක් කණ්ඩායමක් සඳහා NVQ III මට්ටමේ සහතිකය ලබා දී ඇත. ඉතිරි පාසැල් 13 සඳහා මෙම සහතිකය ලබාදීමේ කාර්යය ක්‍රියාත්මකව පවතින බව. | හඳුනාගත් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වශයෙන් පිළිගත් සහතික පත්‍ර (NVQ) පාඨමාලා එකක් පමණක් හඳුනාගෙන තිබීම වැනි කරුණු සඳහා විසඳුම් ලඟාකරගෙන නොතිබුණි. එම නිසා අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීම අපහසු වියහැකිබව නිරීක්ෂණය විය. | | |
| (ආ) | අත්‍යන්ත්‍ර ෂේපකර්මාන්ත ක්ෂේත්‍රයේ දායකත්වය ඉහල නැංවීම තුළින් කර්මාන්ත අංශයෙන් දළ ජාතික නිෂ්පාදනයට දක්වන දායකත්වය සියයට 10 ක් බවට පත්කිරීම තවත් අරමුණක් වී තිබුණි. ඒ සඳහා ෂේපකර්මාන්ත ගම්මාන ආරම්භ කිරීමට කටයුතු කර ඇතත් මේ දක්වා පිහිටුවා ඇති ගම්මානවලින් ක්ෂේත්‍රයට වන දායකත්වය, ඒවායේ වර්තමාන තත්ත්වය සහ සමාලෝචිත වසරේ සැලැසුම් කළ ගම්මාන 10 ක් ආරම්භ නොකිරීම වැනි හේතු නිසා අපේක්ෂිත අරමුණට ලඟාවීමට ඇති හැකියාව සම්බන්ධයෙන් අවධානය යොමුවිය යුතුව පැවති බව නිරීක්ෂණය විය. | ජේෂ කර්මාන්ත ගම්මාන ආරම්භ කිරීම අත්‍යන්ත්‍ර සපයා ගැනීමට නොහැකිවීම මෙන්ම කොවිඩ් අර්බුදය නිසා සිදුකළ නොහැකි බව. | අපේක්ෂිත අරමුණු කරා ලඟාවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | හඳුනාගත් අරමුණු ලඟාකර ගැනීමේ ප්‍රගතිය මැනබැලීමට පාදක වර්ෂයක් හා එම වර්ෂයේ පැවති තත්වය පාදක දත්ත ලෙස හඳුනාගත යුතු වුවත් එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේ ලබාගත් ප්‍රගතිය සියයට 0 ත් සියයට 49 ත් අතර පරාසයක පවතින බව වාර්ෂික කාර්යය සාධන වාර්තාවේ දැක්වීම නිසා එම ප්‍රගතියෙහි නිරවද්‍යතාව තහවුරු කරගත නොහැකි විය. | හඳුනාගත් අරමුණුවල ප්‍රගතිය මැන බැලීමට ඉදිරියේදී කටයුතු සිදුකරනු ලබන බව. | අරමුණුවල ප්‍රගතිය මැනබැලීමට පාදක වර්ෂයක් හා එම වර්ෂයේ පැවති තත්වය පාදක කර ගත යුතුය. |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
| --- | --- | --- |
| 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම හා අදාළ කටයුතු ඇගයීම් කිරීමට දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවේදයක් සකස් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීම සඳහා තොරතුරු රැස් කිරීම හා ඒවා සමාලෝචනය කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කොට ඇති බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

### 5.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව, ගණන්දීමේ නිලධාරී විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගත යුතු වුවද, සමාලෝචිත වසර තුළ එම තනතුර අනුමත කිරීම පමණක් සිදු කර තිබුණි. තවද 2020 වසර සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පැවැත්විය යුතු වුවද, එක් රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි. | කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත වී නොතිබුණු අතර එය අනුමත කර ගැනීමට කටයුතු කර ඇත. සුදුසු නිලධරයෙකු ඉල්ලා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) සහ (2) වගන්ති ප්‍රකාරව කටයුතු කල යුතුය |

**6. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ පැවති පුරප්පාඩු 46 කින් උපදේශක සේවා තනතුරු 15 ක් සඳහා පමණක් බඳවා ගෙන තිබුණද අනෙකුත් පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කර නොතිබුණි. | පේෂකර්ම උපදේශක තනතුරට නව නිලධාරීන් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හා අදාළ රාජ්‍ය අමාත්‍යාංශයෙන් අනුමැතිය ඉල්ලා සිටි අතර නිලධාරීන් බඳවා ගැනීම තාවකාලිකව නතර කිරීමට මුදල් අමාත්‍යාංශය ගත් තීරණය හේතුවෙන් අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය. පසුව පුරප්පාඩු තනතුරු 15 ක් සඳහා බඳවාගෙන ඇති අතර අනෙකුත් තනතුරු සඳහා අදාළ ආයතන වෙතින් ඉල්ලුම් කර ඇත. | අනුමත තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සමාලෝචනය කර සංශෝධනය කරගැනීම කළ යුතුය. |